# යේසුස් වහන්සේ පිළිබඳ ප්‍රීතිය.

# The Joy of Jesus

හිමිදිරි උදය, ලෝකයේ ඇති සෑම දෙයක්ම අලංකාරවත් කරයි. අහස් ගැබ සිසාරා පායා එන හිරු අපට සුපුරුදු සාමාන්‍ය දර්ශනයක් ආනන්දජනක අලංකාරයක් බවට පත් කරයි.

යේසුස් වහන්සේ පිළිබඳ ප්‍රීතිය ද හිමිදිරි උදෑසන බඳුය. ඉතාම සාමාන්‍ය ජීවිතයකට ආලෝකයත් උණුසුමත් ගෙනදෙමින් උදාවන හිරු ඒ ජීවිතයට සුන්දරත්වයක් හා චමත්කාරයක් එක් කරයි.

පායා එන හිරුගේ පිළිබිඹුව ඕනෑම දර්ශනයක් මත පතිත වූ විට එහි ඇති ශෝභාව වර්ධනය වේ. උත්ථාන වූ ක්‍රිස්තුස් වහස්සේ පිළිබඳ ප්‍රීතිය ඉතාම අහිංසක බැතිමතාගේ ජීවිතය තුළින් පිළිබිඹු වන්නේද ඒආකාරයටමය.

යේසුස් වහන්සේ තම දරුවන් ප්‍රීතියෙන් සිටිනු දකින්ට කැමති වන සේක. ප්‍රීතියෙන් පිරුණු ජීවිතයක් ගත කළ හැක්කේ කෙසේදැයි අපට පෙන්වා දුන් සේක.

" මම මාගේ පියාණන්වහන්සේගේ ආඥා රක්ෂාකොට උන්වහන්සේගේ ප්‍රේමයේ යම්සේ පවතිම්ද, එසේම නුඹලාත් මාගේ ආඥා රක්ෂාකරවූනම් මාගේ ප්‍රේමයෙහි පවතින්නහුය. මාගේ ප්‍රීතිය නුඹලා තුළෙහි පවතින පිණිසද නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණවන පිණිසද මේ දේවල් නුඹලාට කීවෙමි. මාගේ ආඥාව නම් මා නුඹලාට ප්‍රේමකළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරපල්ලා යනුය." **(යොහාන් 15:10-12)**

ප්‍රීතියෙන් සිටීමට නම් උන්වහන්සේගේ නියමයන් පිළිපැදිය යුතුය. මේ ප්‍රතිඥාව සමග සම්බන්ධ කරන නියමය කුමක්ද? "මේ මාගේ නියමයයි. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබ එකිනෙකාට ප්‍රේම කළ යුතුය." අපගේ ප්‍රීතිය මනිනු ලබන්නේ අප දෙවියන්වහන්සේ වෙත අවනත වන ප්‍රමාණය අනුව හා අප ඔවුනොවුන්ට ප්‍රේම කරන ප්‍රමාණය අනුවය.

යේසුස් වහන්සේ අපිට ආරාධනා කරයි, "........ නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ඉල්ලාපල්ලා, එවිට නුඹලාට ලැබෙන්නේය " **(යොහාන් 16:24)**

පීඩිටක් අවශ්‍ය වූ විට යේසුස් වහන්සේ වෙතට හැරීමත් උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමත් අපට ප්‍රීතිය ගෙන දෙනවා නිසැකය. ඔබ ඉඩ් සිත් වේදනාවකින් පෙළෙනවිට නැග එන හිරු රැසින් ඔබගේ ආත්මය උණුසුම් වනු ඇත්දැයි ඔබට සැකයක් සිතෙන්නට පිළිවන. දෙවියන් ළඟ ඔබ සඳහා ශුභාරංචියක් ඇත්තේය. මක්නිසාද උන්වහන්සේගේ උදහස ඇසිල්ලකට පමණය. උන්වහන්සේගේ කරුණාව දිවිහිමි කොටය. රාත්‍රියේ හැඩීම පවතින නුමුත්, උදය ප්‍රීතිය පැමිනෙන්නේය. **(ගීතාවලිය 30:5)**

ප්‍රීතියත් ශෝකයත් බොහෝ විට දෙවියන්වහන්සේගේ වචනයට සම්බන්ධ වී ඇති බව අසන ඔබ ඉන් මවිතයට පත්වන්නෙහිද? එය ශෝකය නිසාම ගැඹුරට හෑරෙන ළිඳ ප්‍රීතිය නැමැති ජලයෙන් පිරී යන්නාක් බඳුය.

කනගාටුවෙන් සිටින අවස්ථාවකදී අපි හඬා වැළපෙමින් අන්ධකාරය දෙස එබී බලමින් සිටිනවා

මිස හිමිදිරි උදෑසනට පිටුපා සිටින බව නොදන්නෙමු. ආපස්සට හැරෙන්න. දෙවියන්වහන්සේගේ වචන කෙරෙහි විශ්වාසය රඳවන්න. ආලෝකය ලැබෙන තෙක් හැම අඟනා ප්‍රතිඥාවක්ම රැකගෙන සිටින්න.

ප්‍රීතිය තුළ බලවත් ශක්තියක් ඇත්තේය. අවුරුදු ගණනාවක්ම බැඳීම් වලින් හිර වී සිටි මිනිසුන් දෙවියන්වහන්සේ විසින් ඔවුන්ගේ දේශයට යැවූ සේක. එවිට ඔහු ඔවුන්ට කථා කොට නුඹලා ගොස් රසවත් දේවල් කා මිහිරි පානය බී, කිසිවක් සූදානම් කර නොගත් අයට කොටස් ඇරපල්ලා. මක්නිසාද අද දවස අපේ ස්වාමීන්වහන්සේට ශුද්ධය. ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිවීම නුඹලාගේ ශක්තියය. එබැවින් ශෝක නොවෙල්ලා. **(නෙහෙමියා 8:10)** එතෙක් ජරාජීර්ණව තිබූ නගර නැවත ඉදිකර ගැනීමට ඔවුන්ට උදවුවූයේ දෙවියන්වහන්සේගේ ප්‍රීතියයි. ප්‍රීතිය ඔබගේ දෑත් වලට පමණක් නොව හදවත්වලට ද ශක්තිය ලබා දෙන්නේය.

දේවරාජ්‍යය යනු ධර්මිෂ්ඨකමත් ශුද්ධාත්මයාණන් කෙරෙන් සාමය හා ප්‍රීතිය භුක්ති විඳීමයි. " මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද සමාදානයද ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ." **(රෝම 14:17)** ශුද්ධාත්මයේ බලයෙන් ඔබ තුළ ඇති කිරීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උත්සාහ කළ දේව රාජ්‍යය මෙයයි.

පෙන්තකොස්ත දිනයේදී රාජ්‍යය මිනිසුන් අතර පිහිටුවන ලදී. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ, තමන් වහන්සේගේ ආත්මය එතැනට රැස්ව සිටි සැදැහැවතුන්ගේ ජීවිතය තුළට ප්‍රවේශ කරවූසේක. උන්වහන්සේ ඔවුන් සමග ම සිටිමින් ඔවුන්ට දේශනා කරමින් අවුරුදු තුනහමාරක් ගෙවී ඇත. දැන් උන්වහන්සේ සදාකල්හි ඔවුන් තුළම සිටින සේක.

යේසුස් වහන්සේ ඔබ තුළ ස්වකීය රාජ්‍යය පිහිටවූ සේක්ද? උන්වහන්සේගේ සමීපභාවය පිළිබඳ ප්‍රීතිය ඔබ ළඟ තිබේද? උන්වහන්සේගේ වචනයට කීකරු වන්න. උන්වහන්සේගේ ආත්මය ඔබ පිළිගන්න.

යේසුස් වහන්සේ මේ ජීවිතයෙහි ප්‍රීතිය ඔබට ලබා දෙන සේක. උන්වහන්ගේ දෘශ්‍යමාන (එළිදරවූ) වන විට ඊටත් වඩා ප්‍රීතියක් දානය කිරීමට සැරසී සිටින සේක.

"...... ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය. ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලෙටම සැපත ඇත්තේය." **(ගීතාවලිය 16:11)**

මේ කෙතරම් පියකරු උදෑසනක්ද? මේ කෙතරම් රමණීය දවසක්ද?

**ජීවත් වීමේ ප්‍රීතිය යනු දෙවියන්වහන්සේය.**

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හඳුනා ගැනීමට අපි අද ඔබට ආරාධනා කරමු.**

**You are Invited to Know Jesus Today.**